# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2315/35 - 2023 ජනවාරි මස 19 වැනි බ්‍රහස්පතින්දා - 2023.01.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) (අ) අනු ව්‍යවස්ථාව යටතේ, ම විසින් 2022 ජුලි මස 22 දිනැති අංක 2289/43 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය වරින්වර සංශෝධනය කරන ලදුව,ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1)අනු ව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් 2023 ජනවාරි මස 19 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් වන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**රනිල් වික්‍රමසිංහ,**
ජනාධිපති.

2023 ජනවාරි මස 19 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

## උපලේඛනය

(1) එම නිවේදනයෙහි "අංක 13. ජල සම්පාදන අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එම ශීර්ෂය සහ එම ශීර්ෂය යටතේ ඇති I, II හා III වැනි තීරු ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් ශීර්ෂය හා I, II හා III වැනි තීරු ඇතුළත් කිරීමෙන් ;

13. ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. සෑම පුරවැසියෙකුටම පිරිසිදු පානීය ජලය ලබාදීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය වන ක්‍රියාමාර්ග ගැනීම<br>5. ජලසම්පාදන සේවා, ජලාපවහන පද්ධති සහ සනීපාරක්ෂක පහසුකම් පිළිබඳව සොයාබලා ඒ පිළිබඳව නව සැලසුම් සකස්කර ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව<br>6. ග්‍රාමීය වැව් ජලාශ සහ වාරිමාර්ග පද්ධතීන් සම්බන්ධීකරණය කරමින් ජල සුරක්ෂිතතාව සහ නාගරික ජල යෝජනා ක්‍රම වැඩිදියුණු කිරීම<br>7. පානීය ජලය බෙදාහැරීමේදී සිදුවන ජලය අපතේ යාම වළක්වා ගැනීම<br>8. ප්‍රජා ජල සම්පාදන හා ව්‍යාපෘති කාර්යක්ෂමව හා විධිමත්ව ඉටු කිරීම සඳහා පියවර ගැනීම | 1. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>2. ජල සම්පත් මණ්ඩලය<br>3. ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව<br>4. වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය<br>5. වැවිලි මානව සංවර්ධන භාරය<br>6. සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම<br>7. වතු අංශයේ ස්වයං රැකියා චක්‍රීය අරමුදල | ● ජාතික ජලසම්පාදන සහ ජලාපවහන මණ්ඩල පනත (1974 අංක 2)<br>● ජල සම්පත් මණ්ඩල පනත (1964 අංක 29)<br>● වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය පනත (2018 අංක 32)<br>● සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම පනත (2005 අංක 19)<br>● වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

උපලේඛනය (*සම්බන්ධිතයි*)

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| 9. ග්‍රාමීය ජනතාවට ප්‍රමිතියෙන් යුතු පානීය ජල සැපයීම සඳහා ප්‍රජා ජල සැපයුම් ව්‍යාපෘති නඩත්තු කිරීම හා දියුණු කිරීම | | |
| 10. ග්‍රාමීය පළාත්වල පානීය ජල සැපයුම ස්ථාවර කර ගැනීම ජලාශ, ජල පෝෂිත මාර්ග සංවර්ධනය හා ජල සංරක්ෂණ කටයුතු | | |
| 11. ජාතික වාරිමාර්ග පද්ධතිය මගින් ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමෙන් ක්‍රියාත්මක වන ජලසම්පාදන ව්‍යාපෘති ආශ්‍රිතව ජලය බෙදාහැරීමේ ව්‍යාපෘති කඩිනම් කිරීම | | |
| 12. රජයේ සහ පෞද්ගලික වැවිලි සමාගම්වල සේවය කරන ඉඩම් අහිමි ජනතාව සඳහා නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් නව ගම්මාන සහ නගර නිර්මාණය කිරීම | | |
| 13. වතු අංශයේ ප්‍රජාව ආර්ථික, සමාජයීය හා සංස්කෘතිකමය වශයෙන් සවිබලගැන්වීම සඳහා මූලික පහසුකම්, ජීවනෝපාය උත්පාදන හා ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති ඇතුලු අනෙකුත් අවශ්‍යතා සැපයීමට අවශ්‍ය පියවර ගැනීම | | |
| 14. ග්‍රාමීය වතු අංශයන්හි මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | | |
| 15. වතු ප්‍රජාව ආශ්‍රිතව ප්‍රජා නායකත්වය හා ප්‍රජා සහභාගීත්වය ප්‍රමුඛ වන "ජන මූල මණ්ඩල හා ජන මූල මධ්‍යස්ථාන" පිහිටුවීම | | |
| 16. වතු ප්‍රජාවගේ දරුවන් සඳහා ප්‍රාථමික අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් තහවුරු කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම | | |
| 17. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 18. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

(2) එම නිවේදනයෙහි "අංක 20. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි අංක 36 සිට 40 දක්වා අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ආ) එහි I වැනි තීරුවෙහි අංක 41 සහ 42 දක්වා අයිතමයන් පිළිවෙලින් අංක 36 සහ 37 වශයෙන් නැවත අංක ගත කිරීමෙන්;

(ඇ) එහි II වැනි තීරුවෙහි අංක 18 සිට 21 දක්වා අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ඈ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත සඳහන් අයිතමයන් ඉවත් කිරීමෙන්;

- වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය පනත (2018 අංක 32)
- සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම පනත (2005 අංක 19)

EOG 01 - 0204